# <u>යුරෝපීයන් ගේ ආගමනයට පෙර ආසියාවේ තත්ත්වය</u>




**යුරෝපීයයන් ආසියාවට පැමිණීම**

ඈත අතීතයේ සිටම ආසියාව හා යුරෝපය අතර සබඳතා පැවතුණි. රෝම හා ග්‍රීක වෙළඳුන් විශාල වශයෙන් වෙළඳාමෙහි යෙදී සිට ඇත. රෝම අධිරාජ්‍යයේ අවනතිය සමඟ යුරෝපය පෙරදිග සමඟ සිදුකළ වෙළදාම ද පිරිහීමට පත්වූයෙන් වෙළඳාම පිලිබඳ උනන්දුව තාවකාලිකව නැවතිණි. නමුත් ඉතාලියේ පෞරව රාජ්‍යයන්හි ධනවාදය නැගීඒමත් සමඟ නැවත ආසියාව කෙරෙහි අවධානය වැඩි වී ඇත. ඒ අනුව ආසියාවේ කුළුබඩු, ඇත්දළ, රන්, රිදී, මුතු, මැණික් වැනි වෙළඳ ද්‍රව්‍ය යුරෝපයට ගෙනයන ලදී. එහිදී යුරෝපා වෙළඳුන් හා ආසියාව අතර සබඳතා පවත්වාගෙන ගිය මාර්ග දෙකක් තිබිණි.

- සිරියාව හරහා පර්සියානු වරාය හරහා ඉන්දියාවේ බටහිර වෙරළට පැමිණි මාර්ගය
- ඊජිප්තුව හරහා විත් රතු මුහුදට පැමිණ ඉන්දියාවට පැමිණි මාර්ගය

මේ මාර්ග බොහෝ ප්‍රයෝජනයට ගත්තේ වෙළඳාම ගැන උනන්දුවක් දැක්වූ වැනිසියන්වරු විසිනි. ඉහත කී සිරියානු කාන්තාරය හරහා වැටී තිබුණු මාර්ගය තනිකරම වැනීසියාවේ ඒකාධිකාරයක් විය. ක්‍රිව 1453 කොන්ස්තන්තිනෝපලය තුර්කීන්ට යටත්වීම සමඟ සම්ප්‍රදායී මාර්ග තවදුරටත් ප්‍රයෝජනයට ගැනීමට බාධා එල්ල විය. ඒ අනුව පෙරදිග භාණ්ඩ යුරෝපයට ලබා ගැනීමට නම් ආසියාවට පැමිණීමේ අලුත් මාර්ග සොයා ගැනීමට යුරෝපීයන්ට සිදුවිය.

ක්‍රිව 1498 මැයි 27 වස්කෝද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීමත් සමඟ ආසියාවට නව මාර්ග ඔස්සේ යුරෝපීයන් ගේ පැමිණීමේ බලාපොරොත්තුව මල්ඵල ගැන්විණි. එතැන් සිට සියවස් පහකට ආසන්න කාලයක් පුරා යුරෝපීයන් ආසියාවේ සිය බල ව්‍යාප්තිය අඛණ්ඩව මෙහෙයවීය.

යුරෝපීයයන් ආසියාවට පැමිණීමේ අරමුණු පිරික්සීමේදී මූලික කරුණු කිහිපයකි. ඒ අතර ආර්ථික, ආගමික හා දේශපාලන අරමුණු ඉදිරියෙන්ම සිටී. යුරෝපා බලවතුන් ආසියාවට පැමිණීමේ දී සිය කතෝලික ආගම ව්‍යාප්ත කිරීම මූලික අරමුණක් වී ඇත. කුරුස යුධ සමයේ පටන් ඉස්ලාම් භක්තිකයන් හා කිතුණුවන් අතර පැවති අරගලය ආගමික යුධ දක්වා වර්ධනයවීම ආසියාවට පැමිණීමට මෙන්ම ආසියාවේ දී සිය ආගමික අරමුණු ක්‍රියාත්මක කිරීමට ද ඉවහල් වී ඇත. ඉස්ලාම් ධර්මය පිළිබඳව කිතුනුවන් අතර වූ බද්ධ වෛරය මින් ප්‍රකට වේ. එහිදී ක්‍රිස්තු වහන්සේ ගේ ද්‍රෝහීන් කතෝලික ආගමට හරවා  ගැනීමත් ඈතින් පිහිටි රටවල කතෝලික ආගම පැතිරවීමත් අවශ්‍යතාවය වී ඇත.

මීට අමතරව යුරෝපීයන් ආසියාවට පැමිණීමේ ප්‍රමුඛතම හේතුවක් ලෙස ආර්ථික හෙවත් වාණිජ පරමාර්ථය වැදගත් වේ. ආසියාවේ වෙළඳ ඒකාධිකාරය මුස්ලිම්වරු අත පැවති නිසා එය තමා වෙත ලබා ගැනීම පෘතුගීසි ප්‍රධාන යුරෝපීයන් ගේ අරමුණ වී ඇත. අල්පොන්සෝ ද ඇල්බ්‍යුකර් වරක් මලක්කාවේදී සිය පෘතුගීසි හමුදා වෙත ප්‍රකාශ කර සිටියේ ද මුස්ලිම්වරු සතු වෙළඳ ආධිපත්‍ය මුලුමනින්ම සියතට ගත යුතු බවය. එබැවින් යුරෝපා ආගමනයට පෙර ආසියාවේ මුස්ලිම්වරු කේන්ද්‍ර කරගත් ශක්තිමත් පෘථුල වාණිජ ව්‍යාපාරයක් මෙහෙයවුණු බව ප්‍රකට වේ. මුලදී කුළුබඩු වෙළඳාමේ ඒකාධිකාරය වෙනුවෙන් පෙනී සිටිය ද සියවසක් තුළ එකී අරමුණු වෙනස් වී යුරෝපයට රෙදිපිළි, තේ හා අනෙකුත් භාණ්ඩ ආසියාවෙන් රැගෙන යාම ලෙස සිය අරමුණ වෙනස් වී ඇත. බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයෙන් පසුව යුරෝපයේ නිපැදවුණු භාණ්ඩ සඳහා වෙළද පොළක් සොයා යැමත් අවසානයේ ප්‍රාග්ධනය යෙදවීමත් දක්වා අරමුණු වෙනස් වී ඇත.




**දේශපාලන ක්‍රමය**

මුල්දී යුරෝපීය අපේක්ෂාව වෙළඳාමට සීමාවූවත් 19 වන සියවස සිට එය දේශපාලන අවශ්‍යතා ලෙස වෙනස් වී ඇත. එහිදී යුරෝපීයන් ආසියාතික රටවල් කෙරෙහි පැවැත් වූ මුහුදු ආධිපත්‍යය, අන්තර්ජාතික වෙළඳාම පදනම් කරගෙන නොතිබුණු නමුත් ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන හා රට අභ්‍යන්තර වෙළඳාම හා පදනම් කොට තිබුණු ආර්ථික ක්‍රමය හා ඒ මත ගොඩනැගුණු සමාජය මත වාණිජ ආර්ථික ක්‍රමයක් බලෙන් පැවරීම යුරෝපීයන් විසින් ආසියාවේ දී සිදුකර ඇත. ඒ හරහා මුහුදු බලය හිමි යුරෝපා ජාතීන් ආසියාවේ කටයුතුවල ආධිපත්‍ය දැරීමේ නව තත්ත්වයක් ගොඩනැංවුණි.

රාජාණ්ඩුක්‍රමය විනාශ වී බටහිර ලිබරල්වාදී පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් බිහිවීම ද වැදගත්ය. නියෝජිතයන් පත්කිරීමේ බලය ජනතාව වෙත ලැබීම, සර්ව ජන ඡන්දබලය ක්‍රියාත්මක වීම ඒ අතරින් තවදුරටත් වැදගත් වේ. ප්‍රාදේශීය පාලන විධික්‍රම වෙනුවට යුරෝපීය ආභාසය මත නව ප්‍රාදේශීය පාලන විධික්‍රම බිහිවීය. ගම්සභා ක්‍රමය ඉවත්වීම ඒ අතරින් වැදගත් වේ.

**ආර්ථික ක්‍රමය**

ආසියානුවන් ගේ ආර්ථිකය පදනම් වූයේ ඉඩම් මතය. එහි වැඩි කොටසක හිමිකම මත නැතහොත් රාජකාරී ක්‍රමය මත පදනම් විය. එය යුධ සේවය සඳහා වූ සේවාවකි. එනිසා මුදලින් ලද ආදායම ඉතා සීමාසහිත විය. කුරුඳු, පුවක්, ගම්මිරිස්, මැණික්, ඇතුන් හා මුතු ආදිය රජයේ ඒකාධිකාරයට යටත් වූ වෙළඳ ද්‍රව්‍ය විය. වෙනත් අපනයන වෙළඳ ද්‍රව්‍ය ද පැවති අතර ඒවා යුධ හමුදා පාලන බලයක් මත ක්‍රියාත්මක වූ රාජ්‍ය අධිකාරී වාණිජ්‍ය ක්‍රමයක් මත පැවතිණි. කෘෂිකර්මාන්තය මත පදනම් වූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමවේදයක් ආසියානු රටවල පැවතිණි. මෙනිසා වෙළඳාම යුරෝපියන් ගේ අරමුණ බැවින් සාමන්‍ය ගොවි ජනතාව හා විවිධ ශිල්පීහු දිළින්දන් බවට පත් වූහ.

ඉඩම් අයිතිය කෘෂිකර්මාන්තය, වාණිජ්‍යය, කර්මාන්ත, සේවා ආගමනය, අධ්‍යාපනය ආදී සියලු අංශ කෙරෙහි අවධානය යොමු විය. මෙනිසා ස්වයංපෝෂිත ආර්ථික විනාශ වී වෙළඳ පොළ පදනම් කරගත් ආනයන හා අපනයන ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩනැංවිණි. නව බෝග වගා හඳුන්වා දී ඇත. මිරිස් , දුම්කොළ, පිටරට පලතුරු වර්ග ඒ අතර ප්‍රධාන වේ. ආර්ථිකය මත පදනම් වී රටවල නාගරීකරණය සිදුවී ඇත. සංවර්ධනය හා නාගරීකරණය වීම කොළඹ, මදුරාසිය, ෂැංහායි, ජකර්තා, සිංගප්පූරු වැනි ආකෘති නගර ගොඩනැගිම තුළින් පැහැදිලි වේ. තවද ප්‍රවාහන මාර්ග, දුම්රිය මහාමාර්ග, ඇළවේළි, බලකොටු ආදිය ගොඩනැගීම ද වැදගත් වේ. වැවිලි යුගය මත පදනම් වු සංවර්ධනයක් ඒ ඔස්සේ ක්‍රියාත්මක වී ඇත.

කාර්මික අංශය දියුණු වූ විවිධ කර්මාන්ත ඇතිවිය. ආයුධ, යන්ත්‍රසූත්‍ර, පඩිනඩි පිළිබඳ නව අදහස් මතුවුණි. කුලී කම්කරු ප්‍රශ්න ද ඒ අතරින් වැදගත් ඒවා විය. කම්කරු පන්තියක් බිහිවීම, මධ්‍යම පන්තිය හා දේශීය ප්‍රභූ පන්තිය බිදවැටීම තවත් වැදගත් සිදුවීම් ය.

**සමාජීය තත්ත්වය**

ස්වදේශීයන් අධ්‍යාපනය පිළිබඳ උනන්දු කරවූ අතර එය හුදෙක් ක්‍රිස්තු ධර්මයට වැසියා හැරවීමේ මාර්ගයක් වී ඇත. උසස් තනතුරු ලැබීමට නම් රෙපරමාදු ආගම වැළඳ ගැනීම අත්‍යවශ්‍ය විය. වහල් මෙහෙයෙන් යුක්ත විය. සිංහල රජුන් යටතේ මහා ආණ්ඩුව මහජනයාට තම තමන්ගේ ප්‍රදේශයන්හි කටයුතු පාලනයට ඉඩ දී තිබිණි. මෙය ක්‍රියාවේ යෙදවුයේ ගම් සභාව නම් ආයතනයෙනි. මෙහි පාලනය ගැමියන් මෙහෙයවීය. සාමන්‍ය පාලන කටයුතු හා අධිකරණ කටයුතු ද මෙහෙයවිය. රජුගේ විශේෂ නීති පාලනය කරවූයේ මෙම ආයතනයෙනි. නවීන ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක ලක්ෂණ

මෙහිදී ප්‍රකට විය. කෘෂිකර්මාන්තය හා වෙළදාම පිළිබඳ මෙම ආයතන උනනන්දු වූ නිසා මහජනතාවගේ ජීවිතයේම අංගයක් වී ඇත.

අර්ධ වැඩවසම් ක්‍රමය වෙනුවට ධනවාදී සමාජ ක්‍රමයක් බිහිවිය. ඒ මගින් කුල/ ශ්‍රේණි භේදය, ප්‍රාදේශීය භේදය වෙනස් වී ඇත. අධ්‍යාපන ක්‍රමය විශාල වශයෙන් වෙනස් වී ඇත. සාම්ප්‍රදායික අධ්‍යාපනය වෙනුවට නව පාසැල් අධ්‍යාපන ක්‍රම ආරම්භවීම ඉංග්‍රීසි අධ්‍යාපනය ආසියාව පුරා ප්‍රචලිතවීම ඒ අතරින් වැදගත් ය. කතෝලික ආගම හා එහි ශාඛා ව්‍යාප්ත විය. තවද බටහිර සංස්කෘතිය එනම් ආචාර ධර්ම උත්සව ඇදුම් පැලදුම්, භාෂාව, සනීපාරක්ෂාව, විවිධ සංවිධාන, සේවා මතාන්තර ඇතිවිය. යුරේසියන් ලන්සි, බර්ගර් නව සමාජ කොටස් ඇතිවීම ද තවත් කරුණකි.



**අමතර කියවීමට**

පනික්කාර් කේ.එම්., 2005, ආසියාව සහ බටහිර ආධිපත්‍යය

**නිබන්ධනය**

යුරෝපීයන් ආසියාවට පැමිණෙන විට ඒ රටවල පැවති දේශපාලන, ආර්ථික හා සමාජීය තත්ත්වය පිළිබඳ විමසුමක යෙදෙන්න.